| සුපුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>Zonal Education Office - Minuwangoda |
|---|---|

| වාරය - | | |
|---|---|---|
| ශ්‍රේණිය : 05 ශ්‍රේණිය | විෂයය : ගණිතය | පාඩම : |

## ගැටලු විසඳන්න.

1. පෙට්ටියක කේක් ගෙඩි ප්‍රමාණයක් ඇත. එම එක් ගෙඩියක් 9 ට කැපුවොත් කෑලි 100 ක් ලැබේ. ඒවා එකක් කෑලි 18 කට කැපුවොත් කෑලි කීයක් ලැබේ ද?

2. මිනිසුන් දෙදෙනෙක් එකම ස්ථානයක සිට ප්‍රතිවිරුද්ධ දිශාවට පැයට කි.මී. 6 ක ඒකාකාරී වේගයෙන් ගමන් අරඹයි. පැය 3 කට පසු ඔවුන් අතර දුර කිලෝමීටර කීයද?

3. වෙළෙන්දෙක් තමා ළඟ තිබූ මුදලින් 1/2 බඩු ගැනීමටද, ඉතිරි මුදලින් 1/2 ඇඳුම් සඳහා ද වියදම් කළ පසු ඉතිරි වූ මුදල රු. 1500කි. ඔහු ළඟ මුලින් තිබූ මුදල කීයද?

4. 2020 වර්ෂය අයත් වන්නේ කුමන සියවසක කුමන දශකයකට ද?

5. ළමයෙක් A නම් ස්ථානයේ සිට බටහිර දිශාවට මීටර 50 ක් ගමන් කරයි. තවත් ළමයෙක් A නම් ස්ථානයෙන් පටන් ගෙන නැගෙනහිර දිශාවට මීටර 50 ක් ගමන් කරයි. එතැන් සිට පළමු ළමයා තමාගේ දකුණු අත පැත්තට ද අනෙක් ළමයා තමාගේ වම් අත පැත්තටද හැරී මීටර් 25 ක් ගමන් කර නවතියි. දැන් දෙදෙනා අතර දුර ප්‍රමාණය කොපමණ ද?

6. වෙළඳ පොලක සබන් කැට අසුරා ඇත්තේ යටම පේළියේ 12 ක් ද ඉහළට යන විට එකක් අඩුවන ආකාරයට ය. උඩම පේළියේ ඇත්තේ 1ක් නම් මෙහි ඇති මුළු සබන් කැට ගණන කීය ද?

7. නයනිගේ වයස රමණිගේ වයසින් බාගයකට සමානය. අරුණිගේ වයස නයනිගේ වයසින් බාගයකට සමානය. තිදෙනාගේම වයස්වල එකතුව අවුරුදු 35 ක් නම් රමණිගේ වයස කීයද?

8. පාසල් යාමට සූදානම වන චාමර ජනේලය ළඟට ගිය විට ඔහුගේ මුහුණට හිරු එළිය වැටුනි නම් ඔහුගේ වම් අත පැත්තට ඇත්තේ කුමන දිශාවද?

9. අමිත නිල් සහ රතු පාටට කැමති නමුත් කොළ පාටට අකැමැතිය. සමිත රතු හි කහ පාටට කැමති නමුත් නිල් පාටට අකමැතිය. ප්‍රමිත කොළ හා රතු පාටට කැමතිය. මේ අනුව තිදෙනාම කැමති පාට කුමක් ද?

10. රුවන් සමන්ට පෙර පාසලට පැමිණි අතර නලින් රුවන්ට පෙර පාසලට පැමිණියේ ය. සචින් නලින්ට පෙර පාසලට පැමිණියේ ය. මුලින්ම පාසලට පැමිණියේ කවු ද?

11. එංගලන්තයේ වේලාවට වඩා ශ්‍රී ලංකාවේ වේලාව පැය 5 මිනිත්තු 30ක් වැඩිය. ශ්‍රී ලංකාවේ වේලාව ප.ව. 2.30 වන විට එංගලන්තයේ වේලාව කීය ද?

12. චොකලට් 3 ක හා තල කැරලි 6ක මිල රු. 120.00 නම් චොකලට් 1ක හා තල කැරලි 2ක මිල කීය ද?

13. අමාලි මල් 6ක් අමුණන විට සමාලි මල් 8ක් ද සමාලි මල් 9ක් අමුණන විට තමාලි මල් 12ක් ද අමුණයි. වැඩියෙන්ම මල් අමුණන්නේ කවුද?

14. එක ළඟ පිහිටි ආයතන 3ක නලාවක් නාද කරනු ලබන්නේ මිනිත්තු 6කට, මිනිත්තු 8කට, මිනිත්තු 10කට වරකි. පෙ.ව. 7.00 ට නලා තුනම එක වර හඬ නැගුණු අතර එය එකවර නාද වන්නේ කීයට ද?

15. තාප්පයක සිසුන් පිරිසක් වාඩි වී ක්‍රීඩා තරගයක් නරඹති. එක් කෙළවරක සිට ගැන්න විට 6 වෙනියා වූ නාමල් අනෙක් කෙළවරේ සිට ගණින විට 12 වෙනියා වූයේ නම් තාප්පයේ වාඩි වී සිටි මුළු සිසුන් ගණන කීය ද?

16. බස් නැවතුම්පොළක සිටින 34 දෙනෙක්ගෙන් 26 දෙනෙක් කුඩ ඉහලාගෙන සිටිති. 18 දෙනෙක් තොප්පි දමා සිටිති. තොප්පි දමා කුඩ ඉහළාගෙන සිටින පිරිස කොපමණද?

17. එක් බෝතලයක ටොෆි 04 ක් ද, අනෙක් බෝතලයේ ටොෆි 82ක් ද ඇත. බෝතල් දෙකේම ටොෆි සමාන වීමට වැඩි බෝතලයෙන් අඩු බෝතලයට ටොෆි කීයක් දැමිය යුතු ද?

18. රාක්කයක පොත් අසුරා ඇත්තේ නවකතා, කෙටිකතා හා පද්‍ය ලෙස අනුපිළිවෙළටය. මෙහි 26 වෙනි පොත කුමක් ද?

19. අමාලි ළඟ ඇති මුදල මෙන් දෙගුණයක් නිමාලි ළඟ ඇත. නිමාලි ළඟ ඇති මුදල මෙන් දෙගුණයක් විමාලි ළඟ ඇත. තිදෙනා ළඟම ඇති මුදල රු. 490.00 ක් නම් අමාලි ළඟ ඇති මුදල කීයද?

20. පිට්ටනියක එක පෙළට කොඩි කණු 20 ක් සිටුවා ඇත. කණු 2ක් අතර මල් පෝච්චි 3 බැගින් තබා ඇත. මෙහි ඇති මල් පෝච්චි ගණන කීයද?

## පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1). | 200 | 2). | 36km |
| 3). | රු. 6000.00 | 4). | 21 වන සියවස දෙවන දශකය |
| 5). | 100m | 6). | 78 |
| 7). | අවු. 20 | 8). | උතුර |
| 9). | රතුපාට | 10). | සචින් |
| 11). | පෙ.ව 9.00 | 12). | රු. 40.00 |
| 13). | තමාලි | 14). | පෙ.ව. 9.00 |
| 15). | 17 | 16). | 10 |
| 17). | 9 | 18). | කෙටිකතා |
| 19). | රු. 70.00 | 20). | 57 |